පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

ආයතනයේ නම - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඉණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 79

நிறுவனத்தின் பெயர் : பதிவாளர் நாயகத் திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 79

Name of the Institution – Registrar General's Department

Submission of the Observations of Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order 119(4).

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. (පළමු කොටස)
(2022 මුදල් වර්ෂය)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79
දෙපාර්තමේන්තුව- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

	රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම	ගණන්දීමේ නිලධාරි විසින් ගත් ක්‍රියාමාර්ග	වර්තමාන ප්‍රගතිය
1	පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යාම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.	පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
2	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යාම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.	විගණන සැලැස්ම සකස් කිරීමට පාදක කර ගැනීම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාර අවදානම් ලේඛනයක් අභ්‍යන්තර විගණන අංශය විසින් 2022/2023 වර්ෂයන්ට අදාළව යාවත්කාලීන කර ඇත.
3	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණන විමසුමට අදාළ සියළු අංශ වෙතින් අප්‍රමාදව තොරතුරු ලබාගෙන විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමට පියවර ගෙන ඇත.	හැකිතාක් දුරට ප්‍රමාදයකින් තොරව පිළිතුරු ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.
4	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මාණ්ඩලික නිලධාරි රැස්වීම්වලදී, විගණන කළමනාකරණ රැස්වීමේදී හා ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී නියමිත දිනට අභ්‍යන්තර විගණන විමසුම් සඳහා අදාළ කාලපරිච්ඡේදය තුළ පිළිතුරු ලබාදෙන ලෙස ප්‍රධාන කාර්යාලය ඇතුළු උප කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීමට උපදෙස් ලබාදීම.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා නියමිත දිනයට පිළිතුරු යැවීමට කටයුතු කරමින් පවතී.

5	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	යාවත්කාලීනව තොරතුරු කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.	යාවත්කාලීනව තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.
6	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශය ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාලවකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශය ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාලය තුළ නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.	නියමිත කාලය තුළ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
7	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමේ කටයුතු කඩිනමින් සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදි.	මේ වන විට එම කටයුතු අවසන් කර ඇත.
8	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා ගෙන යාමට උපදෙස් ලබාදී ඇත.	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වාගෙන යමින් පවතී.
9	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර සිදුකරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු සිදු කෙරෙමින් පවතී.
10	මු.රෙ. 94(1) ප්‍රකාරය වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි.	භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාගැනීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදි.	භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා නොදීම හේතුවෙන් මෙම තත්වය ඇති වී තිබේ.

11	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	මාසික හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා සුදුසු පියවරයන් ගන්නා ලෙසත්, මෙහි ප්‍රගතිය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කිරීමටත් පියවර ගෙන ඇත.	අයකර ගත හැකි ණය ශේෂ තවදුරටත් අයකරමින් පවතින අතර, සම්පූර්ණ අයකර ගැනීම ද සිදුකර ඇත. තවදුරටත් අයකර ගැනීමට නොහැකි ණය ශේෂ 2024.05.29 දිනැති රා.මු.චක්‍රලේඛ 01/2024 ට අනුව කපා හැරීමට විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන අතර, වර්ෂය අවසන් වීමට ප්‍රථම සියළු පියවර ගැනීමට කටයුතු කිරීම.
12	පොදු තැන්පත් ගිණුමේ කල්ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල්ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත.	පොදු තැන්පත් ගිණුමේ කල්ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇත.
13	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව යටතේ පවතින සියළුම කාර්යාල සඳහා අතුරු අග්‍රිම ලබාදෙන අතර, එය අදාළ කාර්යය නිමවී මාසයක් ඇතුලත දී නිරවුල් කිරීමට අදාළ උපදෙස් ලබාදී ඇත.	2024 වර්ෂයේ සිට අදාළ කාර්යය නිමවී මසක් ඇතුලත නිරවුල් කරගැනීමට පියවර ගැනීම.
14	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි.	කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.	රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් කොටසක් මෙම දෙපාර්තමේන්තුව වෙතද අනුයුක්ත කල අතර එම නිලධාරීන් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් සිදු කර ඇත.

දෙවැනි කොටස

1	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබානොදීම සම්බන්ධව ඉදිරිපත්වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනුලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	මෙම ලේඛනය නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.	අදාල ලේඛනය පවත්වා ගෙන යනු ලබයි.
2	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මේ සඳහා අවශ්‍ය තාක්ෂණික ක්‍රියාමාර්ග ගෙන මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.	වෙබ් අඩවිය මගින් මහජනයාට විමසීම්, පැමිණිලි, යෝජනා සහ ප්‍රශංසා සටහන් කිරීම සඳහා සුදුසු තාක්ෂණික ක්‍රියාමාර්ග වෙබ් අඩවියට ඇතුලත් කර ඇත. ඒ අනුව මහජන විමසීම්, පැමිණිලි හා යෝජනා යොමු කිරීම සඳහා යොමුවක් (Inquire, Complaints & Suggestions form) ඇති අතර, එමගින් විද්‍යුත් තැපෑලය වෙත මහජන යොමු කිරීම් ලැබේ. භාෂා ත්‍රිත්වයෙන්ම මෙම පහසුකම සලසා ඇත.
3	ආයතනයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි.	කටයුතු සිදු කෙරෙමින් පවතී.
4	සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොකිබුණි.	මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.	කටයුතු සිදු කෙරෙමින් පවතී.

5	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය හිතකර මට්ටමට ලභාකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් ලබා දෙන ලදි.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය හිතකර මට්ටමට ලභාකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.
6	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.	වත්කම් බැරකම් ලේඛන ලබාදී ඇති නිලධාරීන් සහ ලබා දී නොමැති නිලධාරීන්ගේ ලේඛනය අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත 2024.07.19 දිනැතිව යොමුකර ඇත.

ඒ.ආර්.ඒ.එන්.එස්. විජයසිංහ
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
34/3, කවුන්සිල් කොඩිබැකඩුව මාවත
බත්තරමුල්ල

ආර්.ටී.කේ. වැලිවිටගේ
ප්‍රධාන ගණකාධිකාරී
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
සොයිවත්ත, බත්තරමුල්ල.

ලේකම්තුමාගේ නිර්දේශය

රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්ෆ්‍රඩ්හවුස් මාවත, කොළඹ 05.

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍ය සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය.